සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

09 ශ්‍රේණිය

# කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ඉතිහාස පොත් කාණ්ඩයට අයත් අවසාන පොත් දෙක මේ නමින් ඇත.
(1) මකබි (2) බාරුක් (3) එස්තර් (4) සාමුවෙල්

02. ශුද්ධවූ පාවුලුතුමා පෞද්ගලික ලිපියක් මෙතුමාට ලියා තිබේ.
(1) හේබ්‍රෙව් (2) කොලොස්සි (3) තිමති (4) ගලාති

03. බැතිමතුන්ගේ සිත් සතන් දෙවිඳුන් වෙත එසවීමට උපකාර වන යැදුම් පොතකි.
(1) යාච්ඤා නිධානය (2) ශුද්ධ පැය
(3) ගීතාවලිය (4) ප්‍රේම ගී

04. ජේසුස් වහන්සේ නව මෙසියානික ගුරුවරයාණන් බව පෙන්වා දීම අරමුණු කරගත් සුවිශේෂක කතුවරයා,
(1) මතෙව් ය. (2) ජොහාන් ය. (3) ලූක් ය. (4) මාක් ය.

05. A - පොළවේ සාප ලැබීම B - වනයේ පලා කෑම
ඉහත සඳහන් පාපයේ ප්‍රතිඵලයට හිමිකරු වූයේ කවුද?
(1) ඒව ය. (2) කායින් ය. (3) ආබෙල් ය. (4) ආදම් ය.

06. "මම සමිඳාණන් වහන්සේට විරුද්ධව පව් කළෙමි." යන සිතුවිල්ලෙන් මනස්ථාපනය වූ රජතුමා වන්නේ,
(1) සාවුල් ය. (2) සලමොන් ය. (3) දාවිත් ය. (4) ආහාස් ය.

07. 1 රාජාවලිය 6:11-14 සඳහන් පරිදි ජෙරුසලම් දේව මාළිගාව ගොඩ නැගුවේ මෙතුමා ය.
(1) දාවිත් රජ (2) සලමොන් රජ
(3) දාරියුස් රජ (4) ආහාස් රජ

08. ජන්ම පාපය ඉවත් කරනු ලබන්නේ කිනම් ප්‍රසාද නිධානය මගින් ද?
(1) ප්‍රසාද ස්නාපනය (2) පාපොච්චාරණය
(3) දිව්‍ය සත්ප්‍රසාදය (4) රෝගීන්ගේ ආලේපය

09. වයස අවුරුදු හතට පෙර සිදුකරන වැරදි හඳුන්වනු ලබන්නේ,
(1) මුල් අගුණ පව් ලෙස ය. (2) මරණීය පව් ලෙස ය.
(3) බරපතල පව් ලෙස ය. (4) සුළු පව් ලෙස ය.

10. පසුතැවිලි නොවී මරණයට පත්වීම,
(1) ජන්ම පාපයකි. (2) මුල් අගුණ පාපයකි.
(3) ස්වර්ගයට මොර ගසන පාපයකි. (4) ශුද්ධාත්මයාණන් වහන්සේට විරුද්ධ පාපයකි.

11. 'තවත් පව් නොකරන්න.' ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ,

(1) පේදුරු තුමාට ය. (2) පව්කාර ස්ත්‍රීයට ය.

(3) මාර්තාට ය. (4) පාවාදුන් තැනැත්තාට ය.

12. අවුරුදු 33 දී පාස්කු ඉරුදින ප්‍රසාද ස්නාපනය ලබා කිතුනුවකු වූයේ,

(1) ශු. අම්බ්‍රෝස් තුමා ය. (2) ශු. අගුස්තීනු තුමා ය.

(3) ශු. අතනාසියස් තුමා ය. (4) ශු. අන්තෝනි තුමා ය.

13. 1 පේදුරු 3:8-10 අනුව අපගේ විරුද්ධකාරයා ලෙස හඳුන්වන්නේ,

(1) මරණය ය. (2) යක්ෂයා ය.

(3) ලෙඩ රෝගය. (4) දුක් වේදනා ය.

14. අප කළ වැරදි වලට වන්දි ගෙවිය යුතු වේ. එම වන්දි ගෙවීම හඳුන්වනු ලබන්නේ,

(1) සදාකාලික දඬුවම ලෙස ය. (2) ජන්ම පාපය ලෙස ය.

(3) කර්ම පාපය ලෙස ය. (4) කාලීන දඬුවම ලෙස ය.

15. අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් අනුව රෝගීන් ආලේප කිරීමේ වගකීම දරන්නේ,

(1) රදගුරුතුමන්ලා විසිනි. (2) පැවිදි සංඝයන් විසිනි.

(3) පූජා ප්‍රසාදි තුමන්ලා විසිනි. (4) තේවාචාර්ය තුමන්ලා විසිනි.

16. රෝගීන් ආලේපනයේදී ශුද්ධ වූ තෛලයෙන් ආලේප කරනු ලබන්නේ රෝගීන්ගේ,

(1) නළල හා දෑත් ය. (2) දෑත් හා දෙපය ය.

(3) නළල හා හිස ය. (4) ළය හා දෑත් ය.

17. සිය දිවි හානිකර ගැනීම බරපතල මරණීය පාපයක් ලෙස හඳුන්වන්නේ,

(1) තමාට වෛර කරන්නන්ගෙන් පළිගැනීමට උත්සාහ කරන නිසා ය.

(2) දෙවියන් වහන්සේට අයිති වස්තුවක් අප සතු කරගන්නට උත්සාහ කරන නිසා ය.

(3) තම පවුලේ අයට දුක් වේදනාව උරුම කර දෙන නිසා ය.

(4) කතෝලික සංඝය තුළ සභා නීතිය උල්ලංඝනය කරන නිසා ය.

18. අහිංසකයන් පමණක් නොව වරදකරුවන් පවා ඝාතනය නොකළ යුතු බව දෙවියන් වහන්සේ ප්‍රකාශ කළේ,

(1) කායින් ආබෙල් සිද්ධියේ දී ය. (2) ආදම් ඒව පව් කළ අවස්ථාවේ දී ය.

(3) නෝවා සහ ජලගැල්ම අවස්ථාවේ දී ය. (4) බාබෙල් කොත සිද්ධියේ දී ය.

19. අන් ජීවිත වලට ගරු කිරීමේදී අපගේ ජීවිතයෙන් අත්හල යුතු ප්‍රධානම නපුරු ක්‍රියාව වන්නේ,

(1) දුෂ්ටකම ය. (2) වෛරය ය. (3) පළිගැනීම ය. (4) තණ්හාව ය.

20. 'පෙම් කරන්න එකිනෙකාට සුහද සොයුරු ප්‍රේමයෙන්' යන ගීතිකාවේ ඉගැන්වීම් වලට අනුව විපතේ දී කිතුනුවා කළ යුතු වන්නේ,

(1) සාමය පැතිරවීම ය. (2) ඉවසිලිමත් වීම ය.

(3) දිරිමත් වීම ය. (4) ශෝකයට පත්වීම ය.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (i) "මම වෙමි" ප්‍රකාශ 02 ක් ලියන්න.
    (ii) වීර නායකයන් දෙදෙනෙක් නම් කරන්න.
    (iii) ඊශ්‍රායෙල් දේශයට විරුද්දව නැගී සිටි ජාතීන් 02 ක් නම් කරන්න.
    (iv) සාමුවෙල් නම් විනිශ්වයකාරයා දැරූ තනතුරු 02 ක් ලියන්න.
    (v) මුල් අගුණ පව් දෙකක් නම් කරන්න.
    (vi) නැති වූ පුත්‍රයාගේ උපමාවෙන් පෙන්වා දෙන දෙවියන් වහන්සේගේ කිතු ගුණාංග දෙකක් නම් කරන්න.
    (vii) පව් කමාවේ ප්‍රසාද නිධානය සඳහා භාවිතා වන වෙනත් නම් දෙකක් ලියන්න.
    (viii) රෝගීන් ආලේපනයේදී රෝගියාට, එහි සිටින අයට හා කාමරයට ආසිරි පැන් ඉසීමෙන් සිහි ගන්වන කරුණු දෙක ලියන්න.
    (ix) සහෝදර ප්‍රේමයට විරුද්ධ වන කරුණු 02 ක් ලියන්න.
    (x) ''පෙම් කරන්න එකිනෙකට'' යන ගීතිකාවේ සඳහන් කිතුනු සාරධර්ම 02 ක් ලියන්න. (ල. 2 x 10 = 20)

02. (i) වීර නායකයින්ගේ මූලික කාර්යයන් 02 ක් ලියන්න. (ල. 02)
    (ii) ඊශ්‍රායෙල් රාජ්‍යය එක්සේසත් කළ රජවරු තිදෙනෙක් නම් කරන්න. (ල. 03)
    (iii) ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබ ආදර්ශවත් නායකයෙක් ලෙස පාසලේ දී කටයුතු කරන ආකාර 05 කි ලියන්න. (ල. 05)

03. (i) දේව වරප්‍රසාදයේ ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ල. 02)
    (ii) ස්වර්ගයට මොර ගසන පව් වලින් තුනක් නම් කරන්න. (ල. 03)
    (iii) පාපයෙන් වැළකී ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීමට කළ හැකි දේවල් 05 ක් ලියන්න. (ල. 05)

04. (i) සිත් හැරීම තුළ දේව සබඳතාවය ලබාගත් පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)
    (ii) නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව අනුව සිත හැරී ආපසු පැමිණි පුතා වෙනුවෙන් පියා කළ දේවල් තුනක් ලියන්න. (ල. 03)
    (iii) පව් කමාව ලබා සදාකාලික දඬුවමින් මිදී වරප්‍රසාදීය ජීවිතයක් ගත කිරීම සඳහා අන් අය යොමු කිරීමට ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න. (ල. 05)

05. (i) සභා මූලිකයෝ රෝගීන් වෙනුවෙන් කළ ප්‍රධාන කාර්යයන් දෙක ලියන්න. (ල. 02)
    (ii) රෝගීන්ගේ ආලේපය නම් ප්‍රසාද නිධානය ලැබීමට සුදුසු අය කොටස් තුනක් නම් කරන්න. (ල. 03)
    (iii) 'රෝගීන්ගේ ආලේපය දානය කිරීමට ලෙඩෙකු අසාධ්‍ය වනතුරු බලා සිටීම යෝග්‍ය නොවේ.' රෝගියකු වෙනුවෙන් කිතුනු සිසු දරු ඔබට කළහැකි ක්‍රියාකාරකම් 05 ක් ලියන්න. (ල. 05)

06. 'අපගේ ජීවිත ශුද්ධාත්මයාණන්ගේ මන්දිර වේ.'
    (i) ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනාවේදී සිහිගන්වන පනත නම් කරන්න. (ල. 02)
    (ii) මිනිස් ජීවිතය විනාශය කරා ගෙන යන අයහපත් පුරුදු 03 ක් ලියන්න. (ල. 03)
    (iii) තම ජීවිතය මෙන්ම අන් ජීවිතද ආරක්ෂා කර රැකබලා ගැනීම ගැන කිතුනු සඟරාවකට ලිපියක් සකස් කිරීමට ඇතුළත් කළයුතු කරුණු 05 ක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 1 ) 02. ( 3 ) 03. ( 3 ) 04. ( 1 ) 05. ( 4 ) 06. ( 3 ) 07. ( 2 ) 08. ( 1 ) 09. ( 4 ) 10. ( 4 )
11. ( 2 ) 12. ( 2 ) 13. ( 2 ) 14. ( 4 ) 15. ( 3 ) 16. ( 1 ) 17. ( 2 ) 18. ( 1 ) 19. ( 3 ) 20. ( 2 )

## II කොටස

01. (i) සැබෑ මිදිවැල මම වෙමි / මම යහපත් එඬේරා වෙමි. / බැටළුවන්ට දොරටුව මම වෙමි ප්‍රකාශ 7 න් ඕනෑම 2 ක්. (පිටු 18, 19, 20)

(ii) ඔත්නියල්, ඒහුද්, ෂම්ගර්, දෙබෝරා, ගිඩියොන්, තෝලා ජායිර්, ජෙප්තා, ඉබ්ශාන්, එලෝන්, අබ්දෝන්, සැම්සොන් යන අයගෙන් ඕනෑම දෙදෙනෙක්. (පිටුව 37)

(iii) අම්මෝනිවරු / පිළිස්තිවරු (පිටුව 42)

(iv) පූජකයෙකි / දිවැසිවරයෙකි.

(v) උඩගුව, තණ්හාව, රාගය, ක්‍රෝධය, කෑදරය, ඊර්ෂ්‍යාව, අලසකම - ඕනෑම 2 ක් (පිටුව 49)

(vi) ආදරය, කරුණාව (පිටුව 52)

(vii) පාපොච්චාරණය, සමගි සන්ධානය (පිටුව 56)

(viii) ප්‍රසාද ස්නාපන ජලය හා ක්‍රිස්තුස් වහන්සේ (පිටුව 65)

(ix) කෝපය, ක්‍රෝධය, පළිගැනීම (පිටුව 79)

(x) අනුන් උතුම් කොට සැලකීම / උඩගුනොවීම / අලස නොවීම ... යනාදි කරුණු 02 ක් (පිටුව 75)(ල. $2 \times 10 = 20$)

02. (i) ඊශ්‍රායෙල්වරුන්ට එල්ල වූ යුද්ධ වලදී නායකත්වය දීම, ජුදා ජනතාව එක්සේසත් කිරීම, ජාතියක් වශයෙන් ගොඩනැගීමට පදනම සකස් කිරීම - මින් දෙකක් (පිටුව 36) (ල. 02)

(ii) සාවුල් , දාවිත්, සලමොන් (පිටුව 46) (ල. 03)

(iii) අන් අයගේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම. අන් අය මුහුණ දෙන ගැටලු වලදී උදව් කිරීම. අපෙන් වරදක් වූ විට පසුතැවිලි වීම. සමාව ඉල්ලීම. පාසලේ දියුණුව හා යහපත සඳහා කටයුතු කිරීම... වැනි ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු දෙන්න. (ල. 05)

03. (i) ඉෂ්ට වරප්‍රසාදය / අනුග්‍රහ වරප්‍රසාදය (පිටුව 50) (ල. 02)

(ii) මිනී මැරීම / දුගීන්ට හිංසා කිරීම / සේවකයින්ගේ වැටුප් වංචා කිරීම / අස්වාභාවික මෛථුනය (පිටුව 49) (ල. 03)

(iii) යාච්ඤා කිරීම / යහපත් ක්‍රියා කිරීම / දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම / දේව වචනය භාවනා කිරීම / ශුද්ධාත්ම වරම් නිතර පැතීම ... වැනි කරුණු 05 ක්. (ල. 05)

04. (i) සකේවුස් / පව්කාර ස්ත්‍රීය / ශුද්ධවූ අගුස්තීනු මුනිතුමා (පිටුව 54) (ල. 02)

(ii) ඔහුව පිළිගැනීම / සමාව දීම / හොඳම සළුව, මුදුව හා පාවහන් පැළඳ වීම. (පිටුව 52) (ල. 03)

(iii) සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය අවශ්‍යතාව වටහා ගෙන අවශ්‍ය හැම විට ලබා ගැනීම. / පාපය නිසා දේව ආදරය නැතිවී යන අයුරු අන් අයට වටහා දීම / දෙවිඳුන්ගෙන් ඈත්වීමෙන් සිදුවන විනාශය පැහැදිලි කරදීම / සමගිවීමේ ප්‍රසාද නිධානය ලැබීමට ආශාවක් ඔවුන් තුළ ඇති කිරීම / පිළිවෙත අමතකව ගොස් ඇත්නම් නැවත මතක් කර දීම... යනාදි ගැළපෙන පිළිතුරු (පිටුව 60) (ල. 05)

05. (i) රෝගියාව තෙලින් ආලේප කිරීම. රෝගියා වෙනුවෙන් යාච්ඤා කිරීම. (පිටුව 61) (ල. 02)

(ii) වයස්ගත වී හෝ රෝගී වී මරණාසන්නව සිටින අය / බරපතල සැත්කම් වලට සූදානම් කරන අය / මරණාසන්න නොවූවන් / ස්වල්ප කාලයකින් මිය යා හැකි අය. (පිටුව 62) (ල. 03)

(iii) රෝගීන් ආලේපය ලැබිය යුතු අය ගැන සොයා බැලීම / ඔවුන්ව සූදානම් කිරීම / මීසම භාර පියතුමා දැනුවත් කිරීම / රෝගියාගේ බියහා චකිතය පහ කිරීම / රෝගීන් ඇප උපස්ථාන කිරීම. / රෝගීන් වෙනුවෙන් යාච්ඤා කිරීම .... වැනි කරුණු05 ක් (පිටුව 63) (ල. 05)

06. (i) 5 වෙනි පනත - මිනී නොමරන්න. (පිටුව 79) (ල. 02)

(ii) මත්පැන් පානය, දුම් පානය, ශරීර සෞඛ්‍යය ගැන නොසැලකීම, වැරදි ආහාර රටාව (පිටු 72, 73) (ල. 03)

(iii) ජීවිතය දෙන්නේ දෙවිඳුන් බව, ජීවිතය සුරැකීමට පස්වන පනතින් නියම කරන බව, ජීවිත උතුම් බව, ජීවිතය විනාශ වන ආකාරය, ජීවිත සුරැකීමට ගන්නා ක්‍රියාමාර්ග ... යනාදිය හා ගැළපෙන කරුණු සලකා ලකුණු දෙන්න. (ල. 05)